## යටහත් පහත්කමේ යැදුම

ස්වාමින් වහන්ස, ඔබ මුළු විශ්වයේම මැවුම්කාර දෙවියන් වහන්සේය. ඔබ මැවූ මිනිසා ඔබට අකීකරු වී සදාකාලයටම මරණයට ගොදුරු වුනා. ඒත්, ප්‍රේමනීය දෙවියන් වහන්ස ඔබ වහන්සේගේ එකම පුත්‍රයා වන යේසුස් වහන්සේ සියළු මිනිස් වර්ගයාගේ පාපයේ වන්දිය ගෙවන පිණිස කුරුසියේ දුක් විඳලා මැරෙන්න ඉඩ හැරියා. තුන් දවසකට පස්සේ උන්වහන්සේ මරණය පරාජය කර උත්ථාන වුනා. ඒ විතරක් නෙවෙයි ස්වාමිනි, මේ ලෝකයේ අපට වින කරන සියලු අන්ධකාර යක්ෂ, භූත බලවේග, යේසුස් වහන්සේගේ ලේ පූජාවේ අනුහසින් පරාජය කළා. ඒ නිසා උන්වහන්සේ පිළිගන්න මිනිසාට, පාපයෙන්ද, සදාකාල මරණයෙන්ද, සියලු අඳුරු බලවේග වලින්ද දැන් නිදහස තිබෙන බව මා අදහනවා.

ආදරණීය යේසුස් වහන්ස, මා ඔබ වහන්සේගේ පාමුලට එනවා. මා, උපතේ පටන් මේ දක්වා අනන්ත අප්‍රමාණ පාප කරලා තිබෙනවා. මම ඉපදෙනකොටත් පාප ස්වභාවයක් ඇතිවයි ඉපදුනේ. වයසින් වැඩෙන කොට මම සිතින්ද වචනයෙන්ද ක්‍රියාවෙන්ද පව් කළා. මම ඔබවහන්සේට විරුද්ධවද, අනෙක් මනුෂ්‍යයන්ට විරුද්ධවද පව් කළා. මට සමාවෙන්න ජේසුනි,

(ඔබේ සිත දොස් කියන පාප ගැන අවංකවම යේසුස් වහන්සේ ඉදිරියේ කියා සිටින්න.)

.....................................................................

අනේ යේසුස් වහන්ස, ඒ වගේම අනෙක් අය මට විරුද්ධව කළ වැරදි වලට ඔවුන්ට කමාව දෙන්න මට බැරිවුනා. තවමත් මා තුළ ඔවුන් කෙරෙහි වෛරය තිබෙනවා. අනේ යේසුස් වහන්ස, ඔවුන් මට කළ හැම වරදකටම ඔවුන්ට කමා වෙන්න.

(අවංක ලෙස ඔවුන් කළ වැරදි සිහිකර ඔබ ඔවුන්ට කමාව දෙන බව යේසුස් වහන්සේට කියන්න.)

.....................................................................

ආදර යේසුස් වහන්ස, ඔබවහන්සේ මාගේ පාප සියල්ලම කමා කළ නිසා ස්තූතියි. නැවත ඒවා නොකරන්නට මට පුළුවන්කම දෙන්න. ඔබවහන්සේ මාගේ ගැළවුම්කාර දෙවියන් වහන්සේයි. මාව දරුවෙකු සේ පිළිගන්න. මා ආරක්ෂා කරන්න මට මඟ පෙන්වන්න.

මේ සියල්ල ඉල්ලා සිටින්නේ යේසුස් වහන්සේගේ නාමයෙන්ය.

ආමෙන්.

## බලාපොරොත්තුවේ යැදුම

ආදර යේසුස් වහන්ස,
ඔබවහන්සේ ජීවමානයි.
ඔබවහන්සේ මුළු විශ්වයටම අධිපතියාණෝ.
මා ඔබවහන්සේ වෙතට එනවා.
ඔබවහන්සේ මට ආදරේ බව මම දන්නවා.

ඔබවහන්සේ මේ ලෝකයට ඇවිල්ලා මාව සදාකාල විනාශයෙන් මුදා ගන්න පිණිස කුරුසියක දුක් විඳලා මැරුණා. දැන් ජීවමානව වැඩ සිටින බව මම අදහනවා. මට අමරණීය ජීවිතය දෙන ගැළවුම්කරු ඔබවහන්සේ බව මා පිළිගන්නවා. මට වින කරන සියළු දුෂ්ඨ බලවේග ඔබවහන්සේ පරාජය කළා. දැනුත් මා ශාපයෙන්, රෝගයෙන්, අග හිඟකමින්, බියෙන් සැකයෙන් සහ සියළු දුර්වලකම් වලින් මා මුදාගෙන මට සහනය දෙන බව මා විශ්වාස කරනවා.

[ආදර යේසුනි,
අද දවසේ මගේ හිතට වධ දෙන මේ කාරණය දැන් ඔබවහන්සේට භාර කරනවා.

.....................................................................

(ප්‍රශ්නය භාර කරන්න.)]

දැන් ඔබවහන්සේ මගේ හිතේ තිබුණු ප්‍රශ්නය භාරගත්ත නිසා ස්තූතියි. ඔබවහන්සේ මගේ හිතට සහනය දෙන බව මම දැඩි ලෙස විශ්වාස කරනවා. ඔබවහන්සේ වඩාත් යහපත් විදිහට මට උත්තර දෙන නිසා ස්තූතියි. මාව ධෛර්යමත් කරන්න. ශක්තිමත් කරන්න. ඔබවහන්සේගේ ශුද්ධ වචනයේ කියන ආකාරයට,

"ස්වාමින්වහන්සේ පීඩා විඳින සියල්ලන් උදෙසා ධර්මිෂ්ඨ ක්‍රියා හා යුක්තිය ඉෂ්ඨ කරන සේක"
(ගීතාවලිය 103: 6)

ස්තූතියි යේසුස්වහන්ස.....
ස්තූතියි යේසුස්වහන්ස.....
ස්තූතියි යේසුස්වහන්ස.....

ආමෙන්,

"සහනය සුභාරංචි සේවය"

**SMS - 0716833489**
විමසීම් - 0112653959
(සියළු දිනවල රාත්‍රි 9.00 න් පසු)